**දක්ෂිණ අධිවේගී මාර්ග දිගුව ව්‍යාපෘතිය -I කොටස - 2021**

දක්ෂිණ අධිවේගී මාර්ග දිගුව ව්‍යාපෘතියේ - I කොටසේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

ව්‍යාපෘතියේ ණය ගිවිසුම අනුව, මහාමාර්ග අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර, මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ව්‍යාපෘතියේ අරමුණ වන්නේ, ජාත්‍යාන්තර ආයෝජන කේන්ද්‍රයක් ලෙස හම්බන්තොට සංවර්ධනය කිරීම සඳහා සහාය හා කාර්යයන් පහසුකරලීම සඳහා මාර්ග ජාලය සංවර්ධනය කිරීමයි. ණය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත සමස්ථ පිරිවැය රු.මිලියන 103,280 කට සමාන එ.ජ.ඩො. මිලියන 804.11 වූ අතර එයින් රු.මිලියන 87,788 කට සමාන එ.ජ.ඩො. මිලියන 683.49 ක් සැපයීමට චීන අපනයන ආනයන බැංකුව එකඟ වී තිබුණි. ඉතිරි මුදල වන රු. මිලියන 15,492 ක් ශ්‍රී ලංකා රජය විසින් මූල්‍යනය කිරීමට අපේක්ෂා කෙරේ. ව්‍යාපෘතිය එහි කටයුතු 2016 ජනවාරි 19 දින ආරම්භ කරන ලද අතර 2019 ජූලි 18 වන විට නිම කිරීමට නියමිතය.

## 1.3 තත්වාගණනය කළ මතය

මාගේ වාර්තාවේ 2.1 වගුවේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මුදල් ප්‍රවාහයන් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 තත්වාගණනය කළ මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනිව හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හදුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මහහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

| අංකය | ගිණුම්කරණ අඩුපාඩුව | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 08 ට පටහැනිව, ඉඩම් අත්පත් කර ගැනීමේදී ගෙවීමට අවශ්‍ය ව්‍යවස්ථාපිත වන්දි සඳහා රු. මිලියන 21 ක් සහ ප්‍රමාද පොලී සඳහා රු. මිලියන 166 ක් සඳහා ප්‍රතිපාදන 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල සපයා නොතිබුණි. | ස්වාධීන ව්‍යාපෘති අංශය (SPD) වසා දැමීමෙන් පසු, ඉඩම් අත්පත් කර ගැනීම් මාර්ග සංවර්ධන අධිකාරියේ ඉඩම් අංශය වෙත මාරු කර ඇත. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූල විය යුතුය. |
| (ආ) | ජංගම වගකීම් යටතේ ඉඩම් අත්පත් කර ගැනීම සඳහා ගෙවිය යුතු ලෙස පෙන්වා ඇති රු. මිලියන 3.5 ක අවලංගු කරන ලද චෙක්පත සඳහා ලේඛනගත සාක්ෂි එම ශේෂය තහවුරු කිරීම සඳහා විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | අවලංගු කරන ලද චෙක්පතට අදාළ ලේඛනගත සාක්ෂි සොයා ගැනීමට මාර්ග සංවර්ධන අධිකාරියේ ඉඩම් අංශයට උපදෙස් දෙන ලදී. | අවලංගු කරන ලද චෙක්පත් වටිනාකම ලේඛනගත සාක්ෂි සමඟ ගිණුම්ගත කළ යුතුය. |
| (ඇ) | උපදේශකවරයා විසින් සහතික කරන ලද | ප්‍රමාද වූ ගෙවීම සඳහා වන | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ |

| | | | |
|---|---|---|---|
| | ප්‍රමාද පොලී සඳහා හිමිකම් පෑම් සඳහා වූ රු. මිලියන 948.27 ක ප්‍රතිපාදනයක් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | පොලිය 2020 වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශනවල අසම්භාව්‍ය වගකීමක් ලෙස දක්වා ඇති අතර, ව්‍යාපෘතිය අවසන් වූ පසු, සියලු වගකීම් මාර්ග සංවර්ධන අධිකාරිය වෙත මාරු කරන ලදී. | ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූල විය යුතුය. |
| (ඇ) | ව්‍යවස්ථාපිත වන්දි සහ ව්‍යවස්ථාපිත පොලී ගෙවීම් සම්බන්ධයෙන් 2021 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතිය විසින් ඉදිරිපත් කරන ලද විස්තර සහ මූල්‍ය ප්‍රකාශන අතර පිළිවෙලින් රු. මිලියන 127.3 සහ රු. මිලියන 200.83 ක වෙනස්කම් නිරීක්ෂණය විය. | ව්‍යාපෘතිය මඟින් නිකුත් කරන වාර්තා සෑම විටම ක්‍රියාවලිය තුළ හිඟ ගෙවීම් සහ ගිණුම් අංශය විසින් නිකුත් කරන ලද ගෙවීම්වල එකතුවක් වේ. | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව පිළියෙල කළ යුතුය. |
| (ඉ) | 2021 දෙසැම්බර් 31 දිනට සිවිල් වැඩ සඳහා එ.ජ.ඩො. මිලියන 19.51 ක සහ අධීක්ෂණ උපදේශනය සඳහා එ.ජ.ඩො. මිලියන 61.08 ක ඉතිරි ණය ශේෂයට එරෙහිව බැඳීම් ගාස්තු සඳහා ප්‍රතිපාදන දක්වා නොතිබුණි. | ව්‍යාපෘතිය වෙනුවෙන් ගෙවන ලද හෝ ගෙවිය යුතු බැඳීම් ගාස්තු ප්‍රමාණය මහා භාණ්ඩාගාරය විසින් දන්වා නොතිබුණි. එම නිසා මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිපාදන සපයා නොතිබුණි. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූල විය යුතුය. |

## 3. භෞතික කාර්යසාධනය

### 3.1 ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලියේ ප්‍රගතිය

පහත නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|
| 2014 වර්ෂයේ ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය ආරම්භ කර එම ක්‍රියාවලිය කඩිනම් කිරීම සඳහා නිලධාරීන්ට දිරි දීමනා වශයෙන් රු. මිලියන 29.67ක් ගෙවා තිබුණද, 2021 දෙසැම්බර් 31 දින වන විටත් ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය අවසන් කර නොතිබුණි. 2021 දෙසැම්බර් 31 දින වන විට ඉඩම් කැබලි 3600 ක් සඳහා වන්දි මුදල් ලෙස රු. මිලියන 3,762.4 ක් සහ ඉඩම් කැබලි 2,547 ක් සඳහා ප්‍රමාද පොලී ලෙස රු. මිලියන 525.8 ක් ගෙවා ඇති බව නිරීක්ෂණය විය. | ක්‍රියාවලියට සම්බන්ධ එක් එක් සංවිධානවලට අදාළ කාර්යභාරය භාර දීමෙන් පසු කාල සීමාව සඳහා දිරි දීමනා ගෙවීමට සැලසුම් කර ඇත. ඔවුන් නියමිත කාල සීමාව තුළ කාර්යය සාර්ථකව නිම කරන්නේ නම්, වෙනත් ප්‍රමාදයන් සැලකිල්ලට නොගෙන ගෙවීම සඳහා සුදුසුකම් ලබයි. | ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය වේගවත් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

**3.2** **කොන්ත්‍රාත් පරිපාලනය**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

| අංකය | විගණන නිරීක්ෂණ | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කොන්ත්‍රාත්කරු විසින් සේවායෝජකයාගේ පූර්ව අනුමැතියකින් තොරව වාහන ආනයනය කර තිබූ බැවින් නිලධාරීන් ප්‍රවාහනය සඳහා භාවිතා කළ ටොයෝටා ෆෝචූනා වාහන 04 ක්, මර්සිඩීස් බෙන්ස් වෑන් රථ 1 ක් සහ පිකප් රථ 10 ක් සඳහා රේගු තීරුබදු සහනය සඳහා කොන්ත්‍රාත්කරුට ඇති අයිතිය ව්‍යාපෘතිය විසින් ප්‍රතික්ෂේප කර තිබුණි. කෙසේ වෙතත්, පසුව ටොයෝටා ෆෝචූනා වාහන 02 ක් සහ පිකප් රථ 10 ක් සඳහා ගෙවා ඇති රු. මිලියන 91.74 ක තීරුබදු කොන්ත්‍රාත්කරු වෙත ප්‍රතිපූරණය කිරීමට ව්‍යාපෘතියට සිදු වූ අතර, ප්‍රමාද වූ ගෙවීම සඳහා පොලී ලෙස රු. මිලියන 27.55 ක් ද ගෙවීමට සිදු විය. | කොන්ත්‍රාත්තුවේ සාමාන්‍ය කොන්දේසිවල 20.2 උප වගන්තියට අනුව, ව්‍යාපෘතියේ ආරවුල් විනිශ්චය මණ්ඩලය (DAB) පිහිටුවා ඇත. ඒ අනුව, ආරවුල් විනිශ්චය මණ්ඩලය සහ සාමකාමී බේරුම්කරණ කමිටුව (ASC) විසින් ලබා දී ඇති තීරණය අනුව කොන්ත්‍රාත්කරු වෙත අදාළ ගෙවීම් සිදු කර ඇත. | නිවැරදි වේලාවට නිවැරදි තීරණය ගෙන අමතර වියදම් අවම කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | ශක්‍යතා අධ්‍යයන වාර්තාවේ 8.33 පරිච්ඡේදය අනුව සේවා ප්‍රදේශයක් ඉදිකිරීම සඳහා ගැටමාන ප්‍රදේශයේ ඉඩම අත්පත් කරගෙන තිබුණද, එය ඇස්තමේන්තු කර නොතිබූ අතර සේවා ප්‍රදේශය ඉදිකිරීමට ප්‍රමාණ පත්‍රවල ප්‍රතිපාදන සලසා නොතිබුණි. තවද, දක්ෂිණ අධිවේගී මාර්ගයේ කි.මී. 46 න් පසු අධිවේගී මාර්ගය භාවිතා කරන්නන් සඳහා සේවා ප්‍රදේශයක් නොතිබුණි. | අවශ්‍ය යෙදවුම් දක්ෂිණ අධිවේගී මාර්ග දිගුව ව්‍යාපෘතිය- I කොටසේ කොන්ත්‍රාත්තුවේ ප්‍රමාණ පත්‍රවල ඇතුළත් කර නොමැත. | සේවා ප්‍රදේශයක් සඳහා පහසුකම් සැලසීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | අදාළ කොන්ත්‍රාත්කරුගේ පිරිවැයෙන් කාර්යසාධන ඇපකරය ලබා ගැනීම සඳහා කොන්ත්‍රාත්තුවේ සාමාන්‍ය කොන්දේසිවල 4.2 උප වගන්තිය යටතේ දක්වා ඇති ප්‍රතිපාදනවලට පටහැනිව, කාර්ය සාධන ඇපකරය ලබා ගැනීමේ පිරිවැය අයකර ගැනීමට කොන්ත්‍රාත්කරුවන්ට ඉඩ සලසමින් මාර්ග ප්‍රතිසංස්කරණ කටයුතු පිළිබඳ ප්‍රමාණ පත්‍රයේ වෙනම ගෙවීම් අයිතමයක් දක්වා තිබුණි. ඒ අනුව, කාර්ය සාධන ඇපකරවල පිරිවැය ප්‍රතිපූරණය කිරීම සඳහා කොන්ත්‍රාත්කරුවන්ට ප්‍රමාණ පත්‍රවල සඳහන් වටිනාකම රු. මිලියන 97.82 කින් ඉක්මවා 2021 දෙසැම්බර් 31 දින දක්වා රු. මිලියන 322.8 ක මුදලක් අතිරේකව ගෙවා තිබුණි. | කොන්ත්‍රාත්තුවේ ප්‍රමාණ පත්‍රවල කාර්යසාධන ඇපකර සහ අනෙකුත් අවශ්‍ය සියලුම බැඳුම්කර සැපයීමේ පිරිවැය සඳහා ගෙවීම් අයිතම 107 (2) යටතේ ඉඩ ලබා දී ඇත. මෙම අයිතමය වෙන්කල මුදලක් (Provisional Sum) ලෙස ඇතුළත් කර ඇත. | ලංසු ලේඛන නිවැරදිව පිළියෙල කළ යුතුය. |
| (ඈ) | ව්‍යාපෘතියේ උපදේශන සේවා සඳහා වන කොන්ත්‍රාත්තුවේ විශේෂ කොන්දේසිවල 1.10 උප වගන්තියට අනුව, දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ගෙවූ බවට සාක්ෂි ඉදිරිපත් කරන්නේ නම්, ආයතනික බදු වෙන්කල මුදල (Provisional Sum) මගින් ගෙවීම් සිදු කළ හැකිය. උපදේශන ගිවිසුමට මෙවැනි අවාසිදායක කොන්දේසි ඇතුළත් කිරීම නිසා උපදේශකවරයා විසින් ඉල්ලා සිටි රු. මිලියන 53.32 ක ආයතනික බද්ද 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල වගකීමක් ලෙස පෙන්වා තිබුණි. | උපදේශන සමාගම සමඟ අත්සන් කරන ලද ගිවිසුමට අනුව, අදාළ ආයතනික බද්ද ප්‍රතිපූරණය කළ යුතු අතර ඒ අනුව, උපදේශකවරයා විසින් එය ඉල්ලා තිබුණි. එබැවින් රු. මිලියන 53.32 ක් මූල්‍ය ප්‍රකාශනවල වගකීමක් ලෙස පෙන්වා දී තිබුණි. | කොන්ත්‍රාත්කරුවන්ට ලැබෙන වාසිදායක ප්‍රතිලාභ අවම කිරීම සඳහා ගිවිසුම් පිළියෙල කළ යුතුය. |